# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ය චරිතයකින් යුතු **මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික** පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2024** මැයි **24** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**සැ.යු.** : තමන් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රයෙහි ඉහළින් සඳහන් කිරීම අනිවාර්ය වේ.

**අධීක්ෂක /බිල් ලිපිකරු**

**1 වැටුප් පරිමාණය**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 32,330 – 3 x 380/ 10 x 445/ 4 x 660– 40,560/- වේ.

**2 කාර්ය ස්වභාවය**

බිල්පත් සකස් කිරීම, ගෘහපාලනය, ගෙවතු අලංකරණය සහ ආහාරපාන සැපයීමේ කාර්යයන් පිළිබඳ අධීක්ෂණය.

**3 සේවා ස්ථානය**

සෙන්පති නිවස - නුවර එළිය

**4 අයදුම් කළ හැකි තැනැත්තන්**

මෙම තනතුර සඳහා මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් විසින් තම පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

**5 වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**6 අධ්‍යාපන සුදුසුකම්**

i.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය වාණිජ විෂයය ධාරාවෙන් එක් වරකදී (පැරණි නිර්දේශය) විෂයයන් 04 ක් /(නව නිර්දේශය) විෂයයන් 03 ක් සමත් වී තිබීම;

සහ

ii.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත්ව තිබීම

**7 වෘත්තීය සුදුසුකම්**

i.) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මගින් හෝ රජයේ පිළිගත් වෙනත් හෝටල් පාසලක් මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කාලය මාස 05කට නොඅඩු පූර්ණ කාලීන ගෘහ පාලනය සම්බන්ධ මූලික මට්ටමේ පාඨමාලාවක් හෝ ආපනශාලා සේවා සම්බන්ධ මූලික මට්ටමේ පාඨමාලාවක් (Basic Level Course in House Keeping or Basic Level Course in Restaurant and Bar Service) හදාරා සහතිකයක් ලබා තිබීම;

සහ

ii.) වෘත්තීය පුහුණු අධිකාරිය (VTA)/ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක් වෙතින් පාඨමාලා කාලය මාස හයකට නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ සහතිකයක් ලබා තිබීම

**8 පළපුරුද්ද**

සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලද නිවාඩු නිකේතනයක හෝ හෝටලයක අධීක්ෂක මට්ටමේ (Supervisory Level) තනතුරක වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

*සටහන-* පිළිගත් ආයතනයක බිල් ලිපිකරු හෝ ඒ හා සමාන තනතුරක වසරකට නොඅඩු පළපුරද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**9 බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**10 සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි:-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(ඇ) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතුය.

(ඈ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

11 අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

ඉහත සහතික පිටපත්වලට අමතරව පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයේ මුල් පිටපත ද ඇමිණිය යුතු වේ.

12 රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

13 තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

14 අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

15 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

කුෂානි රෝහණදීර
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
2024 මැයි 10 වැනි දින